සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ..........................

**සැලකිය යුතුයි:**

- I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II පත්‍රයට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු පත්‍රයේ පිළිතුරු පත්‍රයට අමුණා භාරදෙන්න.

---

### I පත්‍රය

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රකාශන නිවැරදි නම් ''✓'' ලකුණ ද, වැරදි නම් ''×'' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(01) සමීප අන්තර් පුද්ගල සබඳතා තුළින් පවුලේ සමාජිකයන් එකිනෙකා සමඟ බැඳී සිටිති. ( )

(02) භාණ්ඩ මිලදී ගන්නා විට ඒවායේ මිල ගණන් හොඳින් දැන ගැනීමට මිල දර්ශනය අපට ප්‍රයෝජනවත් වේ. ( )

(03) අප විසින් කළ යුතු දෑ විරිත් ලෙසත්, නොකල යුතු දෑ සිරිත් ලෙසත් හැඳින්වේ.( )

(04) සිංහල හා ඉංග්‍රීසි භාෂාව අප රටේ පවතින ප්‍රධාන භාෂා දෙක වේ. ( )

(05) මෙසුවා නාගසාරියුම් (Mesua nagassarium) යනු ලංකාවේ ජාතික පුෂ්පය හඳුන්වන උද්භිද විද්‍යාත්මක නාමයයි. ( )

- **ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී ඇති හිස්තැන්වලට අදාල නිවැරදි පිළිතුර පහත වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(06) ඔබ සතු උසස් ගතිගුණ, උසස් හැසිරීම් රටා හා සුවිශේෂී හැකියාවන් පිළිබඳ ඔබ ඇතිකරගන්නා හැඟීම ..................................... ගෙන දෙනු ඇත.

(07) ආදර්ශවත් ..................................... කියවීම තුළින් ඔබේ ජීවිතයට වැදගත්වන ආදර්ශ ලබා ගත හැකි වේ.

(08) දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන සිරිත් විරිත් , චාරිත්‍ර ආදිය ..................................... ලෙස හැඳින්වේ.

(09) සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම සඳහා නීතිමය මෙන්ම ..................................... බැඳීමක් අප සැම දෙනා වෙතම පවතී.

Department of Education – Western Province

(10) පුද්ගලයා, සමාජය හා ජීවිතය සාරවත් කරන, පොහොසත් කරන මානුෂික ගුණාංග ...................................... නම් වේ.

( අධිමානය, හැසිරීම්, ආත්මාභිමානය, සාරධර්ම, ගුණ ධර්ම, සම්ප්‍රදායයන්, සදාචාරාත්මක, චරිතාපදාන, පොත්පත්)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) පුද්ගලයෙකුට හෝ පවුලකට සමාජයේ තනිව තම අවශ්‍යතා ඉටුකර ගනිමින් ජීවිතය පවත්වා ගෙන යෑම තරමක් ( පහසු / අසීරු / සිතිය යුතු ) කරුණකි.

(12) භාණ්ඩවල (නිශ්චිත / සිල්ලර / කිලෝවක) මිල දැක්වෙන පාරිභෝගික මිල දර්ශනයක් වෙළඳසැල්වල ප්‍රදර්ශනය කර තැබීම අත්‍යාවශ්‍ය වේ.

(13) දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන (ආකල්ප / සිරිත් විරිත් / ඇදහිලි) චාරිත්‍ර ආදිය සම්ප්‍රදායයන් ලෙස සැලකේ.

(14) ඇතැම් සේවා සැපයීම් වෙනුවෙන් ( විශ්‍රාමිකයන්ට / ශ්‍රමිකයන්ට / විදේශිකයන්ට) ගෙවීම කරනු ලබන්නේ පවරන ලද වැඩ කොටස සාමුදායක ලෙස නිම කිරීමෙන් පසුවය.

(15) අසල්වාසීන් සමඟ (මිත්‍රත්වයෙන් / සහයෝගයෙන්/ අධිෂ්ඨානයෙන්) කටයුතු කිරීම තමන් ජීවත් වන ප්‍රදේශයේ දියුණුවටද හේතුවක් වේ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී 'අ' හා 'ආ' තීරු නිවැරදිව ගලපන්න.**

| අ තීරුව | | ආ තීරුව |
|---|---|---|
| (16) ප්‍රීතිමත් පවුල් පරිසරයක ජීවත් වීම ඔබ සතු | A. | නීතිමය යුතුකමකි |
| (17) දෙමාපියන්ට, වැඩිහිටියන්ට, ආදරය, සෙනෙහස දැක්වීම | B. | අයිතිවාසිකමකි |
| (18) රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය | C. | 119 |
| (19) හදිසි ඇමතුම් අංකය | D. | 1919 |
| (20) රාජකාරිය නිසි ලෙස ඉටුකිරීම | E. | සදාචාරාත්මක යුතුකමකි |
| | F. | 101 |

(ලකුණු 20 x 2 = 40)

Department of Education Western Province

## II පත්‍රය

- පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්යය වේ.
- තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුලු ප්‍රශ්න ගණන 5කි.

(01) (1) පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබට හිමිවිය යුතු අයිතිවාසිකම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) එම අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) චිත්තවේගී අවස්ථා දෙකකට උදාහරණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(4) ජනතාවට අවශ්‍ය තොරතුරු ලබාදෙන මාධ්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(5) අභියෝග වලට මුහුණ දීම සඳහා ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(6) ඔබ ප්‍රදේශයේ ඇති ස්වේච්ඡා සංවිධාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(7) ඔබ / ඔබේ අසල්වාසින් සමග සුහදව කටයුතු කරන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(8) ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයේ ඇති ''සදාකාලික පැවැත්ම'' පෙන්වන සංකේත දෙක නම් කරන්න. (ලකුණු 02)

(02) (1) පවුල් ඒකක වල ස්වභාවය අනුව වර්තමාන සමාජයේ දැකිය හැකි පවුල් වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) පවුලේ සාමාජිකයන් ලෙස ජීවත්වීම නිසා ඔබ ලබන ප්‍රයෝජන 04ක් ලියන්න. (ලකුණු 04)

(3) අයහපත් චිත්තවේගී තත්වයන් පාලනය කර ගැනීම සඳහා අනුගමනය කල හැකි ක්‍රියාකාරකම් 5ක් සඳහන් කරන්න. (ලකුණු 05)

(03) (1) යහපත් සිතුවිලි වර්ධනය කිරීම සඳහා ඔබේ පාසලේ ක්‍රියාත්මක වන වැඩ සටහන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ඔබේ ප්‍රදේශයේ දක්නට ලැබෙන සමාජයේ යහපතට හේතුවන වෙනත් ආයතන 4ක් සඳහන් තරන්න (ලකුණු 04)

(03) අයහපත් චිත්තවේගී තත්වයන් පාලනය කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාකාරකම් 5ක් ලියා දක්වන්න. (ලකුණු 05)

(04) (1) වර්තමාන පවුල් ඒකක වලට අභියෝග රැසකට මුහුණ පෑමට සිදු වී ඇත. එවැනි අභියෝග 2ක් නම් කරන්න. (ලකුණු 02)

(2) පහත දැක්වෙන A, B, C, D, ක්ෂේත්‍රයන්ට අදාළව පවත්නා රැකියා එක බැගින් නම් කරන්න.

A. වී වගා අංශයේ රැකියා -

B. ධීවර කර්මාණ්තය ආශ්‍රිත රැකියා -

C. අධ්‍යාපන සේවාව ආශ්‍රිත රැකියා -

D. වෛද්‍ය සේවාව ආශ්‍රිත රැකියා - (ලකුණු 04)

(3) ඔබ අසල්වාසීන් සමග කටයුතු කරන අවස්ථාවලදී ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග 5ක් ලියන්න. (ලකුණු 05)

Department of Education – Western Province

(05) (1) ඔබේ සංස්කෘතියට අයත් සංස්කෘතික උරුමයන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව පෙන්නුම් කරන සංකේත දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) ජාතික කොඩියේ පහත සඳහන් A,B,C,D,E යටතේ දක්වා ඇති සංකේත මගින් නිරූපණය වන්නේ මොනවාදැයි ලියා දක්වන්න.

A- කහපාට සිංහයා -

B- දකුණතින් ඔසවා ගත් කහපැහැ අසිපත -

C- බෝපත් සතර -

D- කොඩියේ වම්පස ඇති කොළපාට තීරුව -

E- කොඩියේ වම්පස ඇති තැඹිලි පාට තීරුව -

(ලකුණු 05)

(06) (1) සංස්කෘතිය යන්නහි සරල තේරුම සඳහන් කරන්න. (ලකුණු 02)

(2) සංස්කෘතික විවිධත්වයට හේතු වූ කරුණු 04ක් ලියන්න. (ලකුණු 04)

(3) සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම සඳහා පුරවැසියෙකු වශයෙන් අපට කළ හැකි දේ කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

(07) (1) ''සාරධර්ම'' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඔබේ වචනයෙන් ලියන්න. (ලකුණු 02)

(2) පුද්ගලයෙකු තුළ වර්ධනය කර ගත යුතු සාරධර්ම 4ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3)

ඇනුම් පද නොකියම්
බැනුම් කැත බස් නොකියම්
නිකම් බස් නොකියම්
තරම් පමණට වදන් තෙපලම්

a. ඉහත කවිය උපුටා ගත් කෘතිය නම් කරන්න. (ලකුණු 01)

b. මෙම කවියෙන් ඉස්මතු වන සාරධර්ම 4ක් ලියන්න. (ලකුණු 04)

Department of Education – Western Province